# රුහුණු විශ්වවිද්‍යාලය
## 2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි 2000 ස්ථලය
## පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

## ECN 2101 – සූක්ෂම ආර්ථික න්‍යාය

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

**කාලය : පැය 03 යි.**

---

(01)

(අ) ආර්ථික විද්‍යාව තුළ සූක්ෂම ආර්ථික විද්‍යාවේ වැදගත්කම සහ එය අනෙකුත් සමාජ විද්‍යාවන් සමඟ පවත්වන අන්තර් සම්බන්ධතාවය විස්තර කරන්න.

(ලකුණු 06)

(ආ) සූක්ෂම ආර්ථික විද්‍යාව හා සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස ඔබ හඳුනා ගන්නේ කෙසේ ද?

(ලකුණු 06)

(ඇ) ආර්ථික විද්‍යා විශ්ලේෂණයන්හි දී භාවිතා කරන යථානුරූපී ප්‍රකාශ (Positive Statement) සහ අභිමතානුරූපී ප්‍රකාශ (Normative Statement) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(02)

(අ) පාරිභෝජන වරණය පිළිබඳව පවතින ප්‍රධාන උපකල්පන මොනවා ද?

(ලකුණු 04)

(ආ) උපේක්ෂා වක්‍ර සිතියමක ඇති ප්‍රධාන ගුණාංග සුදුසු රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) "උපේක්ෂා වක්‍රයක් සෑම විටම මූලයට උත්තලව නොපිහිටයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(03)

(අ) ආදායම් පාරිභෝජන රේඛාව (Income Consumption Curve) යන්නෙන් පැහැදිලි වන්නේ කුමක් ද?

(ලකුණු 04)

(ආ) "හුවමාරුව සමාජ සුභසාධනය ඉහළ නැංවීමට බලපෑම් කරයි." මෙම ප්‍රකාශය උපේක්ෂා වක්‍ර විග්‍රහය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) උපයෝගිතාවය ඇගයීමේදී භාවිතා කරන සංඛ්‍යා සූචක උපයෝගිතාවය (Cardinal Utility) හා ක්‍රම සූචක උපයෝගිතාවය (Ordinal Utility) අතර වෙනස පහදන්න.

(ලකුණු 06)

24

(04)

(අ) කොබ් - ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතයේ සීමා මොනවා ද?

(ලකුණු 04)

(ආ) එක්තරා නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන ශ්‍රිතය පහත සඳහන් වේ.

$Q = 20L^{0.8}K^{0.2}$ L = ශ්‍රමය K= ප්‍රාග්ධනය

I. මෙම නිෂ්පාදන ශ්‍රිතයට අදාල එක් එක් නිෂ්පාදන සාධකවල ආන්තික නිෂ්පාදිත ශ්‍රිත ලබා ගන්න.

(ලකුණු 04)

II. ආන්තික ආදේශන ශිල්පීය අනුපාතය (MRTS) සඳහා සමීකරණයක් ගොඩනගන්න.

(ලකුණු 04)

III. මෙම නිෂ්පාදන ශ්‍රිතයේ සාධකවල ආදේශන නම්‍යතාවය 1ක බව සාධනය කරන්න.

(ලකුණු 04)

(05)

(අ) නිෂ්පාදන ශ්‍රිතයක් යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයක්, කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයකින් වෙනස්වන ආකාරය උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 04)

(ආ) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කර එයට හේතු දක්වන්න.

I. ව්‍යාපාරයක හිමිකරු තම සේවය වෙනුවෙන් වැටුපක් සිය වියදම්වලින් වෙන් නොකරන හෙයින් ගණකාධිකාරී පිරිවැය ශූන්‍ය වුව ද ආර්ථික පිරිවැය ධන අගයක් ගනු ලබයි.

(ලකුණු 04)

II. ධන ගණකාධිකාරී ලාභයක් හිමිවන ආයතනයකට සෑම විටම ධන ආර්ථික ලාභයක් හිමි නොවේ.

(ලකුණු 04)

III. යම්කිසි ආයතනයක්, දැනට සේවා වියුක්තව සිටින පුද්ගලයෙකු සේවා නියුක්ත කරයි නම්, එම පුද්ගලයා සේවා නියුක්ත කිරීමේ ආවස්ථික පිරිවැය ශූන්‍ය වේ.

(ලකුණු 04)

(06)

(අ) කතිපයාධිකාරී වෙළෙඳපොල තත්ත්වයක පවතින මූලික ලක්‍ෂණ ඒකාධිකාරී තරඟ වෙළෙඳපොල තත්ත්වයක පවතින මූලික ලක්‍ෂණයන්ගෙන් වෙනස්වන ආකාරය පහදන්න.

(ලකුණු 06)

(ආ) කතිපයාධිකාරී වෙළෙඳපොලක නිෂ්පාදන ආයතනයක් තීරණ ගැනීමේ දී එය සංකීර්ණ කාර්යයක් බවට පත් කරන සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) "කතිපයාධිකාරී වෙළෙඳපොලේ, ආයතනික ඉල්ලුම් වක්‍රය සුවිශේෂී ස්වරූපයක් උසුලයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? සුදුසු වක්‍ර සටහන් භාවිතයෙන් ඔබගේ පිළිතුර පහදන්න.

(ලකුණු 06)

(07)

(අ) පසුපසට නැමුණු ශ්‍රම සැපයුම් වක්‍රය (Backward Bending Labour Supply Curve) යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 06)

(ආ) රජය විසින් ශ්‍රම වෙළෙඳපොල තුළ අවම වැටුප් (Minimum Wages) පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ඇ) සාධක වෙළෙඳපොල තුළ ශ්‍රම සාධකය සඳහා ගෙවන වැටුප, **<u>භාණ්ඩ වෙළෙඳපොල ඒකාධිකාරී තත්ත්වයක</u>** සහ **<u>සාධක වෙළෙඳපොල පූර්ණ තරඟකාරී තත්ත්වයක</u>** පවතින්නේ නම් තීරණයවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(08) පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) ශ්‍රම වෙළෙඳපොල තුළ වෘත්තීය සමිතීන් හි කාර්යභාරය.

(ආ) නිෂ්පාදන ශ්‍රිතයක් හා සම නිෂ්පාදනය වක්‍රයක් අතර පවත්නා සම්බන්ධතාවය.

(ඇ) සාමාන්‍ය මුළු පිරිවැය [Average Total Cost (ATC)] හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය [Average Variable Cost (AVC)]

(ඈ) උපේක්ෂා වක්‍ර විග්‍රහයේ ප්‍රායෝගික භාවිතයන්.

(එක් කොටසකට ලකුණු 04 බැගිනි)

@@@@@@@@

25